# ආර්ථික වර්ධනය 5.2% යි

**එච්.අයි. තුෂාර**

වර්තමාන ආණ්ඩුව රට තුළ ගෙනයන ආර්ථික ප්‍රතිපත්ති නිසා 2015 වසරේ කාර්තු හතරෙන් පළමු කාර්තු 03 තුළ සමස්ත ආර්ථික වර්ධනය 5.2% ක් බව ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සඳහන් කරයි.



සමස්තයක් ලෙස 2014 වසරේ දීම වාර්තා කර තිබෙන්නේ 4.5% ක ආර්ථික වර්ධනයක් බවත්, මේ අනුව 2014 වසර සහ පසුගිය වසරේ මුල් කාර්තු තුන සංසන්දනය කළහොත් 0.7% ක වර්ධනයක් අත්සන් කරගෙන තිබෙන බවත් එම අමාත්‍යාංශය මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කළේය.

මෙම වර්ධන වේගය 2010 වසර පදනම් කරගෙන ගණනය කර තිබෙන බවත්, එහෙත් පසුගිය කාලයේ ආර්ථික වර්ධනය 2002 වසර පදනම් කරගෙන සකස් කළ බවත් එම නිවේදනය මගින් පෙන්වා දී ඇත.

පාලන තන්ත්‍රයන් වෙනස් වීමේදී ඇතිවන ජාතික ප්‍රතිපත්තිමය වෙනස තුළ කෙටි කාලසීමාවකදී ආර්ථික සාධකවල චලනයක් පෙන්නුම් කිරීම සාමාන්‍ය තත්ත්වයක් බවද එම නිවේදනයේ සඳහන් කර තිබේ.

ණය වාරික සහ පොලී ගෙවීම, ලෝක ආර්ථිකයේ පසුබෑම තුළින් ඇති වූ බලපෑම ආදිය හේතුවෙන් නිල විදේශ සංචිතවල යම් පහළ යාමක්ද සිදුව තිබෙන බවත්, එහෙත් ඉදිරි මාස කිහිපය තුළ එය යථා තත්ත්වයට පත් කිරීම සඳහා මේ වනවිට මූල්‍ය ක්‍රමෝපායන්ට එළඹීමට මහ බැංකුව කටයුතු කර තිබෙන බවත් එම නිවේදනය මගින් පෙන්වා දී ඇත.

DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO